# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,464 - 2025 නොවැම්බර් මස 21 වැනි සිකුරාදා - 2025.11.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 3312 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 3336 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 දෙසැම්බර් මස 12 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 නොවැම්බර් මස 28 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


3309 - B 82739 - (2025/11)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## කම්කරු දෙපාර්තමේන්තුව

## ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2025

කම්කරු දෙපාර්තමේන්තුවේ **2024.12.31** දිනට පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, එනම් **2025.12.19** දිනට පහත 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** 1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | විදුලි කාර්මික | 01 |
| 02 | පයිප්ප වැද්දුම්කරු | 01 |
| 03 | සංචාරක බංගලා භාරකරු | 02 |

1.2 තනතුරුවල රාජකාරී ස්වභාවය :

| *අනු අංකය* | *තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|---|
| 01 | විදුලි කාර්මික | – විදුලි පහන්, විදුලි පංකා ඇතුළු අනෙකුත් කාර්යාලයීය විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ කටයුතු<br>– විදුලි මෝටර් නඩත්තු කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ කටයුතු<br>– විදුලි පද්ධති නවීකරණය, විදුලි රැහැන් ඇදීම හා වයරිං කිරීම පිළිබඳ කටයුතු<br>– වායු සමකරණ යන්ත්‍ර සවි කිරීම හා ඒවාට විදුලි රැහැන් ඇදීම පිළිබඳ කටයුතු<br>– දුරකතන සවිකිරීම පිළිබඳ කටයුතු<br>– ඉලෙක්ට්‍රොනික් පරිපථ අලුත්වැඩියා කිරීම පිළිබඳ කටයුතු<br>– දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන වෙනත් කාර්යයන් |
| 02 | පයිප්ප වැද්දුම්කරු | – කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල ජලනළ හා මළ අපවාහන පද්ධතිය නඩත්තු කිරීමේ කටයුතු<br>– නව ජලනළ සම්බන්ධතා කටයුතු<br>– සනීපාරක්ෂක හා අනෙකුත් උපකරණ අලුත්වැඩියාව<br>– දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන වෙනත් කාර්යයන් |

| අනු අංකය | තනතුරු නාමය | කාර්යයන් |
|---|---|---|
| 03 | සංචාරක බංගලා භාරකරු | – කම්කරු දෙපාර්තමේන්තුව යටතේ පාලනයවන තමා භාරයේ පවතින සංචාරක බංගලාව සහ භූමිය පිරිසිදුව හා ක්‍රමවත්ව පවත්වා ගෙන යාම හා නඩත්තු කිරීම<br>– පැමිණෙන අමුත්තන්ට අවශ්‍ය පහසුකම් සැලසීම හා සංචාරක බංගලාවට අදාළ භාණ්ඩ, උපකරණ හා වෙනත් වත්කම් සුපරීක්ෂාකාරීව පරිහරණය කිරීම<br>– සංචාරක බංගලාව සතු භාණ්ඩ හා උපකරණවල ආරක්ෂාව පිළිබඳ වගකීම දැරීම<br>– පැමිණෙන අමුත්තන්ට අවශ්‍ය ආහාර පිළියෙළ කර දීම/ ආහාර සකසා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම<br>– දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන වෙනත් කාර්යයන් |

**02.** **බඳවා ගැනීමේ ක්‍රමය :**

මූලික සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයකට කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණය සමත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවා, වෘත්තීය පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත තනතුරුවලට බඳවා ගනු ලැබේ.

**03.** **බඳවා ගැනීමේ සුදුසුකම් :**

3.1. *අධ්‍යාපන සුදුසුකම්.*- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

3.2. වෘත්තීය සුදුසුකම් :-

| තනතුරු නාමය | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| විදුලි කාර්මික | – විදුලි කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම. |
| පයිප්ප වැද්දුම්කරු | – පයිප්ප වැද්දුම්කරු ක්ෂේත්‍රය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම. |
| සංචාරක බංගලා භාරකරු | – සංචාරක බංගලා හෝ තානායම් පාලනය හෝ උද්‍යාන නඩත්තුව හෝ සූපවේදය පිළිබඳ (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම. |

3.3. *පළපුරුද්ද.* - අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර සහතික මගින් සනාථ කළ යුතු ය.

3.4. *කායික සුදුසුකම්.* - සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

3.5. වෙනත් සුදුසුකම් :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

3.6. *වයස.*- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
(රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**04. වැටුප් පරිමාණය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව PL-2-2025 වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට

රු.41,800 - 10X490 - 10X540 - 10X590 - 12X630 - රු.65,560/- ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ.

**05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

5.1 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

5.2 මෙම පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

5.3 III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ක් ගත වීමට පෙර I කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

5.4 රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සම්බන්ධයෙන් 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන හා ඊට ආනුෂංගිකවන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදාළ වේ.

5.5 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, 2013.04.18 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම බඳවා ගැනීමේ පටිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද මෙම පත්වීම යටත් වේ.

**06.** 6.1 වෘත්තීය පරීක්ෂණය :

| *විෂය නිර්දේශය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| විදුලි කාර්මික -<br>– විදුලි රැහැන්වල ධාරිතාව පිළිබඳ සම්මත අගයන්<br>– විදුලි පරිපථ සම්බන්ධ කිරීමේ දී සම්මත මිනුම් නිර්ණය කිරීම<br>– විදුලි පරිපථයට විදුලි බල්බ, විදුලි පංකා සම්බන්ධ කර ඒ සියලුම උපාංග ප්‍රධාන වහරුවට සහ අදාළ උපකරණවලට සම්බන්ධ කිරීම හා එහි ධාරිතාවයන් නිර්ණය කිරීම<br>– විදුලි කෙවෙනිවල ධාරිතාවයට සරිලන පරිදි විදුලි රැහැන්වල ධාරිතාව නිර්ණය කිරීම<br>– වායුසමීකරණ යන්ත්‍රවල ධාරිතාවයට සරිලන විදුලි රැහැන්වල ධාරිතාව නිර්ණය කිරීම හා සම්බන්ධතාවය සකස් කිරීම<br>– විදුලි පද්ධතිවල ඇති වන දෝෂ හඳුනාගැනීමේ ආකාරය සහ දෝෂ ඉවත් කිරීමේ කාර්යය සම්බන්ධව කටයුතු කරන ආකාරය<br>– විදුලි පද්ධතියේ භූගත කිරීම්වල සම්බන්ධතාවය සකස් කරන ආකාරය සහ දෝෂයක් ඇති වූ විට ඒවා පරීක්ෂා කරන ආකාරය සහ දෝෂ ඉවත් කිරීමට අදාළ කටයුතු කරන ආකාරය | 100 | 40% |
| පයිප්ප වැද්දුම්කරු -<br>– T හෝ L මූට්ටු සකස් කිරීම<br>– Valve joint එකක් සකස් කිරීම<br>– කරාම ස්ථානගත කිරීම<br>– එක් එක් කාර්යයන්ට අදාළව අලුත්වැඩියා සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා භාණ්ඩ ලැයිස්තුව ලබා ගැනීම | | |

| විෂය නිර්දේශය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සංචාරක බංගලා භාරකරු<br><br>– නිදන කාමරයක් පිළියෙල කිරීම<br>– කෑම මේසයක් පිළියෙල කිරීම<br>– ආචාරශීලීව අමුත්තන් පිළිගැනීම | | |

6.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය -

| පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 30 | |
| අතිරේක පළපුරුද්ද | 40 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

**07. විභාග ගාස්තු :**

මෙම විභාගය සඳහා ගාස්තුව රු.250/- කි. එම විභාග ගාස්තුව මහජන බැංකුව තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100169026274 දරන ගිණුමට බැර කර ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට නොගැලවන සේ අලවා එවිය යුතුය. (මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

**සටහන :** විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ. මෙම පරීක්ෂණය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය.

**08. අයදුම් කිරීමේ ක්‍රමය :**

8.1 මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත සෙ.මී. 22x29 ප්‍රමාණයේ A4 කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින්;

අ) අංක 01 සිට 07 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද, අංක 08 සිට 10 දක්වා ඡේදයන් දෙවන පිටුවට ද, අංක 11 සිට 14 දක්වා ඡේදයන් තෙවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවට ද වන ලෙස සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය.

ආ) අයදුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් පරීක්ෂණයේ නම සිංහල / දෙමළ මාධ්‍ය අයදුම්පත්‍ර වල සිංහලට දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන, නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු වේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳ අයදුම්කරුවන් විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

8.2 අයදුම්පත් එවිය යුතු ආකාරය:

මෙම අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර අනුව **''ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ................................. තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2025''** යන්න සඳහන් කළ

යුතුය. (අයදුම් කරන තනතුර හිස් තැනට ඇතුළත් කරන්න) තැපැලේ දී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025 දෙසැම්බර් මස 19 දින** හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ.

කම්කරු කොමසාරිස් (පාලන).
කම්කරු දෙපාර්තමේන්තුව,
08 වන මහල,
"මෙහෙවර පියෙස" ගොඩනැගිල්ල,
කොළඹ 05.

8.3 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී ලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

**09.** **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම :**

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම පරීක්ෂණයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් පරීක්ෂණයට පෙර හෝ පරීක්ෂණය පවතින අතරතුර හෝ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම් ලැබීමෙන් පසුව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව අනාවරණය වුවහොත් ඔහු/ ඇය රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

**10.** **අපේක්ෂකයාගේ අනන්‍යතාවය:**

වෘත්තීය පරීක්ෂණය/ සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී අපේක්ෂකයන් ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i.) ජාතික හැඳුනුම්පත,
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii.) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

**11.** මෙම පරීක්ෂණය පැවැත්වීම, පත්වීම් ලබා දීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳ අවසන් තීරණය කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සතු වන්නේ ය.

**12.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,
කම්කරු කොමසාරිස් ජනරාල්,
කම්කරු දෙපාර්තමේන්තුව.

2025 නොවැම්බර් මස 11 දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කම්කරු දෙපාර්තමේන්තුව

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

**ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2025**

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල 2
දෙමළ 3
ඉංග්‍රීසි 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

02. *පෞද්ගලික තොරතුරු :*

2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ……………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ ( PERERA H.A.L.S)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :……………………………………………………………
……………………………………………………………………………………………………

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :…………………………………………………………………
……………………………………………………………………………………………………

03. *ලිපිනය :*

3.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………

3.3 ස්ථිර ලිපිනය(සිංහලෙන්/දෙමළෙන්) :……………………………………………………………………
……………………………………………………………………………………………………

04. ස්ත්‍රී පුරුෂ භාවය : (පුරුෂ-0, ස්ත්‍රී-1)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. ජංගම දුරකතන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

07. විවාහක/ අවිවාහක බව : (අවිවාහක-1, විවාහක-2)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. 8.1 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

8.2 2025.12.19 දිනට වයස : අවුරුදු: මාස: දින:

09. අයදුම් කරන තනතුර : (අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න)

| *අනු. අංකය* | *තනතුරු නාමය* | |
|---|---|---|
| 01 | විදුලි කාර්මික | |
| 02 | පයිප්ප වැද්දුම්කරු | |
| 03 | සංචාරක බංගලා භාරකරු | |

10. අධ්‍යාපන සුදුසුකම්:

10.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය : (පළමුවර)

i. විභාගයේ වර්ෂය හා මාසය : ...............................
ii. විභාග අංකය : ...............................

| *විෂයය* | *සමාර්ථය* | *විෂයය* | *සමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

10.2 අ.පො.ස. (සා.පෙළ) විභාගය : (දෙවනවර)

i. විභාගයේ වර්ෂය හා මාසය : ...............................
ii. විභාග අංකය : ...............................

| *විෂයය* | *සමාර්ථය* | *විෂයය* | *සමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

11. වෘත්තීය සුදුසුකම්:

| *පාඨමාලාවේ නම* | *කාල සීමාව* | *NVQ මට්ටම* | *ආයතනය* |
|---|---|---|---|
| | | | |

12. *පළපුරුද්ද :*

| පුහුණුව ලැබූ හෝ සේවය කළ ආයතනයේ නම | කාල සීමාව |
|---|---|
| | |

13. ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේ ද ?
( අදාල කොටුවේ ( √ ) ලකුණ යොදන්න.

| | | | |
|---|---|---|---|
| ඔව් | | නැත | |

එසේ දඬුවම් ලැබ ඇත්නම් ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න.

.......................................................................................................................................................................................
.......................................................................................................................................................................................

14. *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් විසින් පනවනු ලබන නීති රීති වලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් පරීක්ෂණයට පෙර හෝ පරීක්ෂණයෙන් පසුව හෝ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

(ඇ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු වුවද සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ............................. .............................................
අයදුම්කරුගේ අත්සන

15. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .....................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ................................................. වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

....................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව

දිනය : .......................
සහතික කරන නිලධාරියාගේ නම : .......................
තනතුර: .......................
ලිපිනය: .......................

11 - 279

## බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2025

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ (MN - 4 - 2025) පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් **2025 දෙසැම්බර් 15** දිනට පහත 3.0 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව :**

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01. | කෞතුකාගාර අධිකාරි | 05 |
| 02. | සාම්ප්‍රදායික කලා සහකාරි | 01 |
| 03. | ප්‍රදර්ශන සැලසුම් නිලධාරි | 01 |
| 04. | පර්යේෂණ සහකාර | 06 |
| 05. | අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරි | 09 |
| 06. | ප්‍රධාන ආරක්ෂක නිලධාරි | 02 |

1.2 **තනතුරුවල රාජකාරි ස්වභාවය :**

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| කෞතුකාගාර අධිකාරි | ස්වකීය කෞතුකාගාරයට අයත් සියලුම චංචල හා නිශ්චල දේපළවල ආරක්ෂාව පිළිබඳ වගකීම දැරීම හා කෞතුකාගාරයට අනුයුක්ත කාර්ය මණ්ඩලය පාලනය කිරීම, මූල්‍ය කටයුතු පිළිබඳ වගකීම දැරීම සහ තනතුරට අදාළව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරන අනෙකුත් කාර්යයන් |
| සාම්ප්‍රදායික කලා සහකාර | පැරණි චිත්‍ර පිටපත් කිරීම, සංරක්ෂණය කිරීම, පැරණි කලාත්මක භාණ්ඩවල ආදර්ශක ඇඹීම, ඒවා එක්රැස් කිරීම, අධීක්ෂණය සහ තනතුරට අදාළව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරන අනෙකුත් කාර්යයන් |
| ප්‍රදර්ශන සැලසුම් නිලධාරි | ප්‍රදර්ශන කුටි නිර්මාණය, පසුතල හා ආලෝකකරණය, මැදිරි සැලසුම් කිරීම, ඊට අවශ්‍ය ඇස්තමේන්තු, ද්‍රව්‍ය හා ප්‍රමාණ ලැයිස්තු සකස් කිරීම, ප්‍රදර්ශන සැලසුම් අංශය භාරව කටයුතු කිරීම සහ තනතුරට අදාළව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරන අනෙකුත් කාර්යයන් |
| පර්යේෂණ සහකාර | දෙපාර්තමේන්තුවේ තම විෂයට අදාළ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය කෞතුක භාණ්ඩ, ආදර්ශක සහ දත්ත අදාළ අධීක්ෂණ නිලධාරින්ගේ අනුමැතිය යටතේ රැස්කිරීම, ගබඩා කිරීම, තොරතුරු ලබාගැනීම, ප්‍රදර්ශන පැවැත්වීම, සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩමුළු නියෝජනය කිරීම හා සංරක්ෂණ කටයුතු ඉටුකිරීම යන කාර්යයන් සඳහා දායක වීම. |
| අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරි | කෞතුකාගාර නරඹන්නන් සඳහා සංදර්ශක සේවය සැපයීම, දෙපාර්තමේන්තුව සංවිධානය කරන අධ්‍යාපනික සම්මන්ත්‍රණ, දේශන, වැඩමුළු හා ප්‍රචාරාත්මක කටයුතු ඉටුකිරීම සහ කෞතුකාගාර පාලන කටයුතුවලට සහාය වීම. |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරි | දෙපාර්තමේන්තුවට අයත් සියලුම කෞතුකාගාරවල ආරක්ෂාව පිළිබඳ කටයුතු ඉටුකිරීම, මුර සේවකයින් මෙහෙයවීම, යෙදවීම හා අධීක්ෂණය, ඔවුන්ගේ පුහුණුවීම් සම්බන්ධව කටයුතු කිරීම, දෙපාර්තමේන්තුවේ ආපදා කළමනාකරණ කමිටුවට සහාය වීම, නවීන ආරක්ෂක ක්‍රම කෞතුකාගාරවල ස්ථාපිත කිරීමට අදාළව කටයුතු කිරීම, කෞතුකාගාරවල ආරක්ෂාව සම්බන්ධයෙන් අදාළ අංශ සමඟ සම්බන්ධීකරණය සහ තනතුරට අදාළව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරන අනෙකුත් කාර්යයන් |

**2.0 සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

2.1 3.0 ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයින් පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට කටයුතු කරනු ලැබේ.

2.2 කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**3.0 සුදුසුකම් :**

3.1 අධ්‍යාපන සුදුසුකම් :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| කෞතුකාගාර අධිකාරි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. |
| සාම්ප්‍රදායික කලා සහකාර | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලලිතකලාවේදී (චිත්‍ර) උපාධියක් ලබා තිබීම. |
| ප්‍රදර්ශන සැලසුම් නිලධාරි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාස්තු විද්‍යාව සහ නිර්මිත පරිසරය පිළිබඳ උපාධියක් ලබා තිබීම. |
| පර්යේෂණ සහකාර | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම. ඉතිහාසය හෝ පුරාවිද්‍යාව හෝ මානව වංශ විද්‍යාව හෝ සමාජ විද්‍යාව හෝ මානව විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ ඇතුළත්ව උපාධියක් ලබා තිබීම. |
| අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම. ඉතිහාසය හෝ පුරාවිද්‍යාව හෝ මානව වංශ විද්‍යාව හෝ සමාජ විද්‍යාව හෝ මානව විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ ඇතුළත්ව උපාධියක් ලබා තිබීම. |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. |

3.2 වෘත්තිය සුදුසුකම් :

ප්‍රධාන ආරක්ෂක නිලධාරි තනතුරු සඳහා ශ්‍රී ලංකා ශිෂ්‍ය භට බලකායේ කෙඩෙට් නිලධාරියෙක් ලෙස පුහුණුව ලබා තිබීම හෝ ආරක්ෂාව සම්බන්ධයෙන් පිළිගත් ආයතනයක පාඨමාලාවක් හදාරා තිබීම.

සෙසු තනතුරු සඳහා අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

3.3 පළපුරුද්ද :

සාම්ප්‍රදායික කලා සහකාර තනතුර සඳහා පැරණි චිත්‍ර පිටපත් කිරීම, ඒවා සංරක්ෂණයේ දී නැවත පින්තාරු කිරීම, පැරණි කලාත්මක භාණ්ඩවල ආදර්ශක ඇඹීම ආදිය ගැන මනා පළපුරුද්දක් තිබීම.

සෙසු තනතුරු සඳහා අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

3.4 කායික සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුරට අයදුම් කිරීම සඳහා උස 5' 5" (සෙ.මී. 165.10) හෝ ඊට වැඩි සහ පපුව 32" (සෙ.මී. 157.48) හෝ ඊට වැඩි ශ්‍රී ලාංකික පිරිමි පුද්ගලයෙක් විය යුතු ය.

3.5 වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. සේවයට බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**4.0 වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

**5.0 සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

5.1 මෙම තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. එතෙකුදු වුවත් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට නිලධාරීන් යටත්විය යුතු ය.

5.2 පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

5.3 III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

5.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාල අනුව සපුරා ගත යුතු ය.

5.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**6.0 වැටුප් ප්‍රමාණය :**

මෙම තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයෙහි MN-4-2025 අනුව

**රු. 53,060 – 10 x 800 - 11 x 1, 190 – 10 x 1320 – 5 x 1350 – රු. 94,100 (මාසික)**

වැටුප් පරිමාණයක් හිමි වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

**7.0 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ (MN-4-2025) තනතුරු සඳහාවන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී පහත පටිපාටිය අනුව ලකුණු ලබාදීම සිදුකරනු ලැබේ.

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 2. වෘත්තීය සුදුසුකම් | 15 | |
| 3. භාෂා ප්‍රාගුණ්‍යය | 15 | |

| ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 4. පරිගණක දැනුම | 20 | අදාළ නොවේ |
| 5. පුහුණුව හා පළපුරුද්ද | 30 | |
| 6. සම්මුඛ පරීක්ෂයේ දී දක්වන ලද කුසලතාවය | 05 | |
| **එකතුව** | **100** | |

**** සැලකිය යුතුයි :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

**8.0 අයදුම් කිරීමේ ක්‍රමය :**

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී. 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතු ය.

8.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපැලේ දී අස්ථානගතවන අයදුම්පත් සම්බන්ධව කෙරෙන කිසිඳු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම, අයදුම්කරු මෙම තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.5 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම්කරන තනතුර අනුව "ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ ................" තනතුරට බඳවා ගැනීම - 2025 යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

8.6 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

8.7 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

**9.0 අයදුම්පත් යොමු කිරීම :**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025 දෙසැම්බර් මස 15 දින** හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
අංක 53,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

10.0 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම :

සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති හා නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් හට පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනට සතියකට පෙර ලැබෙන සේ කැඳවීමේ ලිපි නිකුත් කරනු ඇත.

කැඳවීමේ ලිපිය ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයෙකුට යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

11.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු රියදුරු බලපත්‍රය.

12.0 සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :

යම් අපේක්ෂකයෙකුට මෙම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට කලින් හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරේදී හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13.0 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි හා ඊට සිදුකර ඇති සංශෝධනයන් හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

14.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවන මෙම මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

15.0 මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.

**සනූජා කස්තූරිආරච්චි,**
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

2025 නොවැම්බර් මස 12 දින,

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ***
***.............................................. තනතුර සඳහා බඳවා ගැනීම - 2025***

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

1.0

1.1 මුලකුරු සමඟ නම : (මුලකුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: PERERA A.B.C

..........................................................................................................................................

..........................................................................................................................................

1.2 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
..............................................................................................................................................
..............................................................................................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන් / දෙමළෙන්)
..............................................................................................................................................
..............................................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

1.5 උපන්දිනය :

වර්ෂය: | | | | |    මාසය: | | |    දින: | | |

1.6 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු: | | | | |    මාස: | | |    දින: | | |

1.7 ස්ත්‍රී/ පුරුෂ භාවය : (පුරුෂ - M, ස්ත්‍රී - F) [ ]

1.8 විවාහක / අවිවාහක බව : විවාහක : [ ]    අවිවාහක : [ ]

(√ ලකුණ යොදන්න)

2.0 ස්ථිර ලිපිනය :

2.1 ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :..............................................................................................................
..............................................................................................................................................

2.2 සිංහලෙන්/ දෙමළෙන් : ..........................................................................................................
..............................................................................................................................................

2.3 කැඳවීමේ ලිපිය එවිය යුතු ලිපිනය : ......................................................................................
..............................................................................................................................................

3.0 ස්ථිර පදිංචියට අයත් :

3.1 පළාත් සභාව............................................................................................................

3.2 දිස්ත්‍රික්කය : ..........................................................................................................

4.0 දුරකතන අංකය :

ස්ථාවර : [ ]    ජංගම : [ ]

5.0 අධ්‍යාපන සුදුසුකම් :

| *සමත් වූ උපාධිය/ පශ්චාත් උපාධි සුදුසුකම්* | *පන්තිය* | *විශ්වවිද්‍යාලය* | *උපාධි සම්පූර්ණ කළ දිනය* |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

(අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකපත් වල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ එවිය යුතු ය)

6.0 වෘත්තීය සුදුසුකම්:

| *හදාරා ඇති පාඨමාලාව* | *ආයතනය* | *ලබා ඇති වෘත්තීය මට්ටම* | *පාඨමාලාව සම්පූර්ණ කළ දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

7.0 පළපුරුද්ද :

| *සේවා ස්ථානය* | *තනතුර* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

8.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(√ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

8.1 "ඔව්" නම් විස්තර සඳහන් කරන්න : ..................................................................................................................
..................................................................................................................

9.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙක් වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) තවද යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

.........................................................

අයදුම්කරුගේ අත්සන

දිනය : ............................................

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු / ඇය .................................. දින මා ඉදිරිපිට දී ඉහත 9.0 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

.............................................................

සහතික කරන්නාගේ අත්සන

දිනය : ............................................
සහතික කරන්නාගේ නම : ........................................
තනතුර : ..............................................................
ලිපිනය : ..............................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11 - 289/1

---

## බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

### ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2025

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ගණයේ (PL - 1 - 2025) පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් 2025 දෙසැම්බර් 15 දිනට පහත 3.0 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවාගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01. | කෞතුකාගාර මුරකරු | 10 |
| 02. | සහකාර මුර පරීක්ෂක | 01 |

1.2 තනතුරුවල රාජකාරී ස්වභාවය :

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| කෞතුකාගර මුරකරු | කෞතුකාගාරයේ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම දැරීම හා ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| සහකාර මුර පරීක්ෂක | රාත්‍රී කාලයේ කෞතුකාගාරයේ සේවයේ නියුතු මුරකරුවන් නිසිලෙස ස්ථානගත කර ඔවුන්ගේ රාජකාරි අධීක්ෂණය සහ ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |

**2.0** ***සේවයට බඳවාගැනීමේ ක්‍රමය :***

යෝග්‍යතා ඇගයීමේ ප්‍රායෝගික පරීක්ෂණයක හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

2.1 3.0 ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයින් පමණක් යෝග්‍යතා ඇගයීමේ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීමට කටයුතු කරනු ලැබේ.

2.2 කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ ප්‍රායෝගික පරීක්ෂණයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවාගැනීමට කටයුතු කරනු ලැබේ.

**3.0** ***සුදුසුකම් :***

3.1 අධ්‍යාපන සුදුසුකම් :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| කෞතුකාගාර මුරකරු | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. |
| සහකාර මුර පරීක්ෂක | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. |

3.2 *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

කෞතුකාගාර මුරකරු තනතුරට හා සහකාර මුර පරීක්ෂක තනතුරට අයදුම් කිරීම සඳහා උස 5' 5" (සෙ.මී. 165.10) හෝ ඊට වැඩි සහ පපුව 32" (සෙ.මී. 157.48) හෝ ඊට වැඩි ශ්‍රී ලාංකික පිරිමි පුද්ගලයෙක් විය යුතු ය.

**3.3** ***වෙනත් සුදුසුකම් :***

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. සේවයට බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

4.0 ***වයස :***
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**5.0** ***සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :***

5.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. එතෙකුදු වුවත් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට නිලධාරින් යටත්විය යුතුය.

5.2 පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

5.3 III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩයිම සමත් විය යුතු ය.

5.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාල අනුව සපුරා ගත යුතු ය.

5.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

***6.0 වැටුප් ප්‍රමාණය :***

මෙම තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයෙ හි PL-1-2025 අනුව

**රු. 40,000 – 10 x 450 - 10 x 490 – 10 x 540 – 12 x 590 – රු. 61,880 (මාසික)**

වැටුප් පරිමාණයක් හිමි වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

***7.0 යෝග්‍යතා ඇගයීමේ ප්‍රායෝගික පරීක්ෂණය හා සම්මුඛ පරීක්ෂණය:***

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ (PL-1-2025) තනතුරු සඳහා වන යෝග්‍යතා ඇගයීමේ ප්‍රායෝගික පරීක්ෂණයේ දී සහ සම්මුඛ පරීක්ෂණයේ දී පහත පටිපාටිය අනුව ලකුණු ලබාදීම සිදුකරනු ලැබේ.

| *පරීක්ෂා කර බලා ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. ප්‍රායෝගික පරීක්ෂණය :<br><br>ප්‍රායෝගික පරීක්ෂණය කෞතුකාගාරයක රාජකාරි වලට අදාළව ලබාදෙන මැදිරියක සරල ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලින් සමන්විත වේ. | 60 | අදාළ නොවේ |
| 2. තනතුරට හිමි ක්ෂේත්‍රයට අදාළව රජය පිළිගත් ක්ෂේත්‍රයට සම්බන්ධ කර ගත හැකි ආකාරයේ හදාරණ ලද පාඨමාලා හෝ සුදුසු වැඩසටහන් | 15 | |
| 3. ක්‍රීඩා සහ වෙනත් බාහිර ක්‍රියාකාරකම් | 20 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේ දී පිළිඹිබු කරන ආකල්ප සහ පෞරුෂය සඳහා | 05 | |
| **එකතුව** | **100** | |

* සටහන :
අයදුම්කරුවන් අතරින් යෝග්‍යතා ඇගයීමේ ප්‍රායෝගික පරීක්ෂණයේ දී හා සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන කුසලතා අනුපිළිවෙලින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

***8.0 අයදුම් කිරීමේ ක්‍රමය :***

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී. 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතු ය.

8.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථානගතවන අයදුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම, අයදුම්කරු මෙම තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.5 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම්කරන තනතුර අනුව "ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (ශිල්පීය නොවන) ශ්‍රේණියේ ...................... තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

8.6 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.7 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

***9.0 අයදුම්පත් යොමු කිරීම :***

සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025 දෙසැම්බර් මස 15 දින** හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
අංක 53,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ - 07.

***10.0 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම :***

සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති හා නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් හට පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනට සතියකට පෙර ලැබෙන සේ කැඳවීමේ ලිපි නිකුත් කරනු ඇත. කැඳවීමේ ලිපිය ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයකුට යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

***11.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය :***

යෝග්‍යතා ඇගයීමේ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු රියැදුරු බලපත්‍රය.

***12.0 සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :***

යම් අපේක්ෂකයකුට මෙම යෝග්‍යතා ඇගයීමේ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට කලින් හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරේ දී හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13.0 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි හා ඊට සිදුකර ඇති සංශෝධනයන් හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

14.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

15.0 මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් තීරණය කරනු ඇත.

**සනූජා කස්තුරිආරච්චි,**
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

2025 නොවැම්බර් මස 12 දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ගණයේ***
***...................................................................... තනතුර සඳහා බඳවා ගැනීම - 2025***

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

1.0

1.1 මුලකුරු සමඟ නම : (මුලකුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: PERERA A.B.C
..........................................................................................................................................................
..........................................................................................................................................................

1.2 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
..........................................................................................................................................................
..........................................................................................................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන් / දෙමළෙන්)
..........................................................................................................................................................
..........................................................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

1.5 උපන්දිනය :

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

1.6 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : | | | | | මාස : | | | දින : | | |

1.7 ස්ත්‍රී/ පුරුෂ භාවය : (පුරුෂ - M, ස්ත්‍රී - F) | |

1.8 විවාහක / අවිවාහක බව : විවාහක : | | අවිවාහක : | |

(√ ලකුණ යොදන්න)

2.0 ස්ථිර ලිපිනය :

2.1 ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :..............................................................................................................
..............................................................................................................

2.2 සිංහලෙන්/ දෙමළෙන් : ..............................................................................................................
..............................................................................................................

2.3 කැඳවීමේ ලිපිය එවිය යුතු ලිපිනය : ..............................................................................................................
..............................................................................................................

3.0 ස්ථිර පදිංචියට අයත් :

3.1 පළාත් සභාව : ..............................................................................................................

3.2 දිස්ත්‍රික්කය : ..............................................................................................................

4.0 දුරකතන අංකය :

ස්ථාවර [ ] ජංගම [ ]

5.0 අධ්‍යාපන සුදුසුකම් :

1. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ )

වර්ෂය: ................................................. විභාග අංකය : ...................................

| *සමත් වූ විෂය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

2. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ )

වර්ෂය: ................................................. විභාග අංකය : ...................................

| *සමත් වූ විෂය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

| *සමත් වූ විෂය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

(අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකපත්වල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ එවිය යුතු ය.)

**6.0** **ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?**
(√ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

6.1 "ඔව්" නම් විස්තර සඳහන් කරන්න : ..........................................................................................................
..........................................................................................................................................................

***7.0*** ***අයදුම්කරුගේ සහතිකය :***

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශකර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙක් වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව දැන සිටිමි.

(ඇ) තවද යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

.........................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ............................................

***8.0*** ***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :***

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු / ඇය ................................. දින මා ඉදිරිපිට දී ඉහත 7.0 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

...........................................................,
සහතික කරන්නාගේ අත්සන.

දිනය : ............................................
සහතික කරන්නාගේ නම : ........................................
තනතුර : ..............................................................
ලිපිනය : ..............................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11 - 289/2

## අධිකරණ සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා අධිකරණ සේවයේ පුරප්පාඩු

**ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරි (මහෙස්ත්‍රාත්) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

01. අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තැනැත්තන්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත අයදුම්පත් භාරගන්නා අවසන් දිනයවන **2025.12.12 දින** හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු ය. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අයදුම්කරුගේ ලිපිනය පැහැදිලිව සඳහන් කරන ලද රු. 110 ක (විභාග අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑල මගින් යොමු කිරීම සඳහා) වටිනාකමකින් යුතු මුද්දර අලවන ලද ලියුම් කවරයක් ද අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**02. වැටුප් ක්‍රමය : රු. 131,300-10x2940-රු.160,700**

(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක. 03/2025 අනුව) අධිකරණ නිලධාරින්ට හිමි දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

**03. සෑම අයදුම්කරුවෙක් ම :**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය;
(ආ). විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(ඇ). ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

**04. සුදුසුකම් :**

(අ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු තුනකට නොඅඩු කාලයක් ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිටින හෝ යෙදී සිටි නීතිඥවරයකු වීම;

*හෝ*

(ආ). අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී වසර තුනකට නොඅඩු සේවා කාලයක් ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ/ අභියාචනාධිකරණයේ නීති පර්යේෂණ නිලධරයකු ලෙස සේවය කර ඇති නීතිඥවරයකු වීම;

*හෝ*

(ඇ). අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යම් අමාත්‍යාංශයක, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් රජයේ ආයතනයක අවුරුදු තුනකට නොඅඩු කාලයක් නීති නිලධරයකු ලෙස සේවය කර ඇති සහ එම කාලය තුළ නිරතුරුවම අධිකරණය ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයකු වීම;

*හෝ*

(ඈ). අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යම් සමාගමක හෝ බැංකුවක හෝ ආයතනයක නීති නිලධරයකු ලෙස අවුරුදු තුනකට නොඅඩු කාලයක් සේවයකර ඇති සහ එම කාලය තුළ නිරතුරුවම අධිකරණය ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයකු වීම.

*සැ. යු. :* ඉහත (අ.), (ආ.), (ඇ.) සහ (ඈ.) යන ඡේදයන් හි සඳහන්කර ඇති "අවුරුදු තුනකට නොඅඩු" සේවා කාලය/ ක්‍රියාකාරි වෘත්තිය කාලය ගණනය කිරීමේ දී, ඉහත (අ.), (ආ.), (ඇ.) සහ (ඈ.) හි සඳහන් සේවා කාලයන්/ ක්‍රියාකාරි වෘත්තිය කාලයන් හි සංකලනයන් ද සලකා බැලේ.

05. සියලුම අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එහි ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණයකට / පරීක්ෂණවලට කැඳවනු ලැබේ.

*සටහන :*

01. අයදුම්පත් ගාස්තුව රු. 15,000/- කි. එම මුදල මහජන බැංකුවේ, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක. 297100199025039 දරන "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව" යන ගිණුමට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් ලදුපත ලියාපදිංචි තැපැල් මගින් හෝ පෞද්ගලිකව පැමිණ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්වීමෙන් අයදුම්පත් ලබා ගත හැක. මුදල් ගෙවීම සඳහා අදාළ ලදුපත සම්පූර්ණ කිරීමේ දී ලදුපතේ අදාළ ස්ථානයේ අයදුම්කරුගේ නම සහ ලිපිනය සටහන් කළ යුතු ය.

02. සිය අයදුම්පත ලබා ගැනීම සහ සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරදීම ලියාපදිංචි තැපැලෙන් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත පෞද්ගලිකව පැමිණ සිදුකළ යුතු වේ.

03. රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරින් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පමණක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් ලබා ගැනීම සහ ඉදිරිපත් කිරීම සඳහා ලිපිනය :

ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
කොළඹ 12.

**ප්‍රසන්න අල්විස්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2025 නොවැම්බර් මස 13 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

11 - 313

**සංශෝධනයයි**

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

**ආධුනික ශිෂ්‍යභට නිලධාරි සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරිනි පුරප්පාඩු**

වර්ෂ 2024 ක් වූ ඔක්තෝබර් මස 25 දින අංක 2408 දරන *ගැසට්* පත්‍රයේ I කොටසේ (IIඅ) ඡේදයේ පළ කරන ලද නියමු පොදු රාජකාරි ශාඛාව සඳහා පවතින පුරප්පාඩු පහත පරිදි සංශෝධනය වන අතර අනෙකුත් සුදුසුකම් සහ විස්තරයන් වෙනස් නොවන බව දන්වා සිටිමි.

**ඉවත් කිරීම**

**නියමු පොදු රාජකාරි ශාඛාව (පිරිමි)**

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත් ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද, සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉන් ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු ය. අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂයය ධාරාව/ ජීව විද්‍යා විෂයය ධාරාව (භෞතික විද්‍යාව අනිවාර්ය විෂයයක් ලෙස ඇතුළත්ව තිබිය යුතු ය) හෝ තාක්ෂණය විෂයය ධාරාවෙන් (තාක්ෂණවේදය සඳහා විද්‍යාව අනිවාර්ය විෂයයක් ලෙස ඇතුළත්ව තිබිය යුතු ය). එක් වරක දී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතු යි.

**ඇතුළත් කිරීම**

**නියමු පොදු රාජකාරි ශාඛාව (පිරිමි/කාන්තා)**

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත් ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද, සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉන් ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු ය. අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂයය ධාරාව/ ජීව විද්‍යා විෂයය ධාරාව (භෞතික විද්‍යාව අනිවාර්ය විෂයයක් ලෙස ඇතුළත්ව තිබිය යුතු ය) හෝ තාක්ෂණය විෂයය ධාරාවෙන් (තාක්ෂණවේදය සඳහා විද්‍යාව අනිවාර්ය විෂයයක් ලෙස ඇතුළත්ව තිබිය යුතු ය). එක් වරක දී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතු යි.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ශිෂ්‍ය නිලධාරි පුරප්පාඩු - ඉදුරාම බඳවාගැනීම්**

වර්ෂ 2024 ක් වූ ඔක්තෝබර් මස 25 දින අංක 2408 දරන *ගැසට්* පත්‍රයේ I වන කොටසේ (IIඅ) වන ඡේදයේ පළ කරන ලද තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව සහ වෛද්‍ය ශාඛාව සඳහා පවතින පුරප්පාඩු පහත පරිදි සංශෝධනය වන අතර අනෙකුත් සුදුසුකම් සහ විස්තරයන් වෙනස් නොවන බව දන්වා සිටිමි.

**ඉවත් කිරීම**

**තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව**

**මෘදුකාංග ක්‍රම ලේඛක ඉංජිනේරු නිලධාරින් - පිරිමි/ කාන්තා (නිත්‍ය)**

පරිගණක හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව ඉංජිනේරු උපාධිය හෝ පරිගණක හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව උපාධිය හෝ පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස අන්තර්ගත භෞතික විද්‍යාවේදී උපාධිය හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාවක් (HNDIT) හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව ඩිප්ලෝමාවක් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පරිගණක සම්බන්ධ සාමාජිකත්වය (IESL) ලබා තිබීම හෝ බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ සාමාජිකත්වය (BCS) හෝ ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ සාමාජිකත්වය (ACS) ලබා තිබීම. මෘදුකාංග සංවර්ධන කුසලතා පිළිබඳව පළපුරුද්ද හෝ Java, C# or C/C++, HTML/ XHTML/ HTML 5, CSS3 (Cascade Styel Sheet), React JS, Angular JS, Ajax JavaScript, J Query, PHP, MySQL, ASP.NET, MSSQL, enterprise technologies (Such as Web services, APIs, XML, JSON, SSO, JMS) ,cloud technologies and container technologies (AWS, Azure and Docker), micro services, enterprise integration and API management පිළිබඳව පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**ඇතුළත් කිරීම**

**තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව**

**මෘදුකාංග ක්‍රම ලේඛන ඉංජිනේරු නිලධාරින් - පිරිමි / කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා - නිලඇඳුම් කාණ්ඩය/ නිල ඇඳුම් නොවන කාණ්ඩය)**

පරිගණක හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව ඉංජිනේරු උපාධිය හෝ පරිගණක හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව උපාධිය හෝ පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස අන්තර්ගත භෞතික විද්‍යාවේදී උපාධිය හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාවක් (HNDIT) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පරිගණක සම්බන්ධ සාමාජිකත්වය (IESL) ලබා තිබීම හෝ බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ සාමාජිකත්වය (BCS) හෝ ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ සාමාජිකත්වය (ACS) ලබා තිබීම. මෘදුකාංග සංවර්ධන කුසලතා පිළිබඳව පළපුරුද්ද හෝ Java, C# or C/C++, enterprise technologies (such as Web services, APIs, XML, JSON, Flutter, Node JS, MVC5), cloud technologies and container technologies (Such as AWS, Azure and Docker), micro services, enterprise integration, Data Base Administration, DevOps and API management පිළිබඳව පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**ඉවත් කිරීම**

**වෛද්‍ය ශාඛාව**

**කායික රෝග පිළිබඳ විශේෂඥ - පිරිමි / කාන්තා (ස්වේච්ඡා)**

(අ) කායික විද්‍යාව පිළිබඳ MD පශ්චාත් උපාධිය
(ආ) මණ්ඩලයේ සහතිකලත් විශේෂඥ වෛද්‍යවරයකු ලෙස SLMC ලියාපදිංචිය.

**ඇතුළත් කිරීම**

**වෛද්‍ය ශාඛාව**

**කායික රෝග පිළිබඳ විශේෂඥ - පිරිමි / කාන්තා (නිලඇඳුම් නොවන කාණ්ඩය - ස්වේච්ඡා)**

(අ) කායික විද්‍යාව පිළිබඳ MD පශ්චාත් උපාධිය
(ආ) මණ්ඩලයේ සහතිකලත් විශේෂඥ වෛද්‍යවරයකු ලෙස SLMC ලියාපදිංචිය.

**වී. බී. එදිරිසිංහ,**
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී (සිව්වරක්), යූඑස්පී, එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී, කිව්එච්අයි
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාපති

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය 2025 (2026)

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය **2026 මාර්තු මස කොළඹ දී** පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "අපගේ සේවා" යටතේ ඇති "මාර්ගගත අයදුම්පත් (බඳවාගැනීම්/කාර්යක්ෂමතා කඩඉම් විභාග)" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 නොවැම්බර් මස 24 දින පෙ.ව. 09.00** ට විවෘත වන අතර **2025 දෙසැම්බර් මස 26 දින ප.ව. 09.00** ට අවසන් වේ.

අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

02. විදුහල්පති සේවයේ සෑම නිලධාරියකු ම බඳවා ගැනීමේ දින සිට වසර (03) තුනක් ඇතුළත සන්ධාන භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතුය. ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 8/2020 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීම තුළින් මෙම පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් විය හැකිය. එසේ නොමැති සෙසු නිලධාරීන් මෙම පරීක්ෂණය සමත් විය යුතු ය.

03. මෙම විභාගයට අදාළ විෂයය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළකර ඇත. ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය එක් ප්‍රශ්න පත්‍රයකින් සමන්විතවන අතර, අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂයය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(අ) විභාග පටිපාටිය - විෂයය නිර්දේශය පහත පරිදි වේ:

(1) සාමාන්‍ය ඉංග්‍රීසි (General English)
ලකුණු 100 - කාලය පැය 03

විෂයය නිර්දේශය :

Suitable level of proficiency on the following forms of grammar in the written language is expected from the candidate:-

- Tenses and Numbers
- Sentences (Simple/Compound/Complex/Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

The knowledge on the modern formats and styles of writing is tested in following area of study:-

- Summary writing
- Report writing
- Essay writing

04. සාමර්ථය ලැබීම සඳහා මෙම විෂයයට අපේක්ෂකයකු අවම වශයෙන් 40% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.1. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. විභාග අපේක්ෂකයන් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු නොකරනු ඇත.

05. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදුකරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු

සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහාවන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

07. ඉල්ලුම් පත්‍ර **2025 දෙසැම්බර් මස 26** දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයට ලැබෙන පරිදි විදුහල්පති / කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ /කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව ලිවිය යුතු අතර මෙදිනට පසු එවනු ලබන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා, අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

09. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුයි. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුයි. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

(i.) ජාතික හැඳුනුම්පත,
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii.) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළැඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු යි.

11. විභාග ගාස්තු : විභාග ගාස්තුව රු. 250.00 කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය:

(i.) ඕනෑම බැංකු කාඩ්පතක් මගින්
(ii.) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින්
(iii.) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින්
(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින්

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

12. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණ වේ.

13. සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

14. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 නොවැම්බර් මස 14 දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

11 - 338

---

**මොරටුව විශ්ව විද්‍යාලයීය තාක්ෂණික ආයතනය**

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2025/2026

මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, **හෝමාගම, දියගම පිහිටි මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය තුළ පැවැත්වෙනු ඇත.**

**01.** **සාමාන්‍ය :**

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑ අවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික කාර්මික පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත් වේ. මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ:

(අ) නාවුක අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (Set 1)
- i. නාවුක ඉංජිනේරු තාක්ෂණය
- ii. නෞකා චලන අධ්‍යයනය

(ආ) අනෙකුත් අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (Set 2)
- i. රසායන ඉංජිනේරු තාක්ෂණය
- ii. සිවිල් ඉංජිනේරු තාක්ෂණය
- iii. විදුලි ඉංජිනේරු තාක්ෂණය
- iv. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය
- v. තොරතුරු තාක්ෂණය
- vi යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය
- vii. බහු අවයවික (පොලිමර්) තාක්ෂණය
- viii. ජේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය

**02.** **යෝග්‍යතාවය**

2.1. වයස :

2.1.1 2024.12.31 දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 24ට වැඩි නොවිය යුතු ය.

2.1.2. නෞකා චලන අධ්‍යයනය හා නාවුක ඉංජිනේරු තාක්ෂණය යන විෂයය ක්ෂේත්‍රයන් හැදෑරීමට අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී 2024.12.31 දිනට වයස අවුරුදු 20ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එම විෂයය ක්ෂේත්‍රයන් සඳහා සිසුන් තෝරා ගැනීමේ දී විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් විය යුතු වේ.

2.1.3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාල හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති **සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.**

2.2. අධ්‍යාපන සුදුසුකම් :

2.2.1. අයදුම්කරුවන්, ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2022, 2023 හෝ 2024 වසරේ පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී එකවර පහත සඳහන් විෂයයන් 03 සමත්විය යුතු ය :

(i) භෞතික විද්‍යාව ;
(ii) රසායන විද්‍යාව;
(iii) සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය.

2.2.2. නෞකා චලන අධ්‍යයනය හා නාවුක ඉංජිනේරු තාක්ෂණය යන පාඨමාලාවන් සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන්හට අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන (C) සාමාර්ථයක් තිබීම අනිවාර්ය වේ.

**03. තෝරා ගැනීමේ පදනම/ ක්‍රියාපටිපාටිය :**

3.1 පාඨමාලාවට ඇතුළත් කර ගැනීම :

3.1.1. ශිෂ්‍යයන් තෝරා ගැනීම අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණයේ සාමාර්ථය මත සිදු වේ.

3.1.2. යෝග්‍යතා පරීක්ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ.පො.ස. (උ.පෙළ) විභාග ලකුණුවල කුසලතාව මත (Z ලකුණු මත) සිසුන් තෝරා ගනු ලැබේ. 40% ක් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ කුසලතාව මත හා 60% ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරා ගැනීම සිදුවේ.

3.2. අධ්‍යයන ක්ෂේත්‍රය :

3.2.1. යෝග්‍යතා පරීක්ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල, අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

**04. අයදුම් කිරීමේ පිළිවෙල :**

4.1 අයදුම්පත් පෝරම :

4.1.1. අයදුම්කරුවන් පළමුව සිය අයදුම්පත, පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියෙහි දක්වා ඇති මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) හරහා ඉදිරිපත් කළ යුතු ය.

http://www.itum.mrt.ac.lk

4.1.2. මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) ඉදිරිපත් කිරීමෙන් පසු අයදුම්කරුවන් ස්වයංක්‍රීයව ජනනය වන මාර්ගගත අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත භාගත කර ගත යුතු ය.

4.1.3. භාගත කළ මුද්‍රිත පිටපතේ අන්තර්ගතය අයදුම්පතෙහි දක්වා ඇති පරිදි සහතික කළ යුතු වේ. (අයදුම්පතෙහි 03 සහ 05 යන ඡේද බලන්න)

4.1.4. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත බහාලන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ **"ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව සඳහා ඇතුළත් වීම - 2025/2026"** යනුවෙන් සඳහන් කර **ලියාපදිංචි තැපෑලෙන් "සහකාර ලේඛකාධිකාරී, අධ්‍යයන හා ශිෂ්‍ය කටයුතු අංශය, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය, දියගම, හෝමාගම"** යන ලිපිනයට එවිය යුතු ය.

4.1.5. මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර යොමු කළ යුතු අතරම අයදුම්පතෙහි මුද්‍රිත පිටපත ද ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර ලැබිය යුතු ය.

4.1.6. තම ලිපිනය ලියන ලද රු. 110/- ක් වටිනා මුද්දර අලවන ලද 9"X4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද අයදුම්පත සමඟ එවිය යුතු ය.

*වැදගත් :*

**සෑම අයදුම්කරුවෙකුම නියමිත දිනට පෙර මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) සහ එම අයදුම්පතෙහි මුද්‍රිත පිටපත යන දෙකම ඉදිරිපත් කළ යුතු වේ. මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) සහ අයදුම්පතෙහි මුද්‍රිත පිටපත ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ අයදුම්කරුවන්ගේ අයදුම්පත් වැඩිදුර කටයුතු සඳහා සලකා බලනු නොලබන අතර අසම්පූර්ණ අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

4.2. අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීම :

4.2.1. මෙම පාඨමාලාව අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩ දෙකකින් සමන්විත වේ.

4.2.2. නාවුක අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 1) හෝ අනෙකුත් අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) හෝ ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක.

4.2.3. නාවුක අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩයේ දී එනම් නාවුක ඉංජිනේරු තාක්ෂණය සහ නෞකා

වලන අධ්‍යයනය (SET 1) සඳහා ප්‍රමුඛතාව සඳහන් කිරීමේ දී වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද, අනෙක් ක්ෂේත්‍රය 02 ලෙස ද සඳහන් කළ යුතු ය.

4.2.4. අනෙකුත් ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) සඳහා ප්‍රමුඛත්වය 1,2,3,4,5,6,7,8 සඳහන් කළ යුතු අතර වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද, ඊළඟ ක්ෂේත්‍රය 02 ලෙස ද අන්තිම ක්ෂේත්‍රය 08 ලෙස ද සඳහන් කළ යුතු ය.

05.

5.1. ඉල්ලුම් පත් ගාස්තු :

5.1.1. ඉල්ලුම්පත් ගාස්තු වශයෙන් එක් ක්ෂේත්‍ර කාණ්ඩයක් සඳහා රු. 1,000 (රු. දහසක්) ද, ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා රු. 1,200 (රු. එක්දහස් දෙසියයක්) ද, ගෙවිය යුතු අතර, එම ගෙවීම මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය - ලංකා බැංකුවේ හෝමාගම ශාඛාවේ ගිණුම් අංක 83062337 දරන ගිණුමට බැර වන සේ ගෙවිය යුතු ය. මෙම අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

5.1.2. මුදල් ගෙවූ රිසිට්පතෙහි ස්කෑන් (Scan) කළ පිටපතක් මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) සමඟ යොමු කළ යුතු අතර අයදුම්පතෙහි මුද්‍රිත පිටපත සමග රිසිට්පතෙහි මුල් පිටපත අමුණා එවිය යුතු ය.

5.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2025.12.30** දින වේ.

**06. යෝග්‍යතා පරීක්ෂණය :**

අයදුම්කරුවන් විසින් අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ලබාගත් ප්‍රතිඵල, කුසලතා පදනම මත හා එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ලසු කළ සිසුන් ප්‍රමාණය මත, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**07. පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම :**

යම් පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

- අ.පො.ස. (උ.පෙළ) සහතිකය,
- අ.පො.ස. (උ.පෙළ) Z ලකුණ සඳහන් සහතිකය,
- පාසැල් හැරයාමේ සහතිකය,
- උප්පැන්න සහතිකය,
- සහතිකපත්වල හා අදාළ ලියකියවිලිවල නමෙහි යම් වෙනස්කම් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්.

**08. ඉතා වැදගත්:**

**8.1. ජාතික තාක්ෂණික ඩිප්ලෝමා හැදෑරීම සඳහා ලියාපදිංචිවන කිසිම අපේක්ෂකයෙකු, එම පාඨමාලාවේ කාල සීමාව, තුළ දී මෙම ආයතනයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් (විවෘත විශ්වවිද්‍යාල හැර) හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදෑරීමට සුදුසුමක් නොලබයි.**

**8.2 මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාල හැර) හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.**

**8.3. අයදුම්පතෙහි සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි විය යුතු අතර යම් ලෙසකින් තොරතුරු අසත්‍ය බව අනාවරණය වුවහොත්, අයදුම්කරු ඕනෑම අවස්ථාවක පාඨමාලාවෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.**

අධ්‍යක්ෂ,
මොරටුව විශ්වවිද්‍යාලයීය
තාක්ෂණික ආයතනය.

2025 නොවැම්බර් මස 13 දින,
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය.

11 - 339